ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
**Department of Examinations, Sri Lanka**
NATIONAL EVALUATION AND TESTING SERVICE

පැලවත්ත, බත්තරමුල්ල.
பெலவத்தை" பத்தரமுல்ல.
**Pelawatta, Battaramulla.**

දුරකථන අංක / தொலைபேசி / **Telephone**: **2786200, 2784201, 2785202, 2784203, 2784204, 2786205, 2784206, 2787207**

ෆැක්ස් / பெக்ஸ் / Fax: **011-2785220**

තැපැල් ලිපිනය / அஞ்சல் முகவரி / POSTAL ADDRESS: තැ.පෙ. 1503 කොළඹ / த.பெ. 1503 கொழும்பு / P.O. Box 1503 Colombo

අන්තර්ජාල ලිපිනය / இணையதள முகவரி / Web Address: **www.doenets.lk** **www.results.exams.gov.lk**

e-mail: **exams@doenets.lk**

මගේ අංකය / எமது இல / My No.: 1/1/ මාධ්‍ය නිවේදන 2025

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2025.10. 17

---

**සියලු ම මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,**

පහත සඳහන් නිවේදනය ඔබ විද්‍යුත් / මුද්‍රිත මාධ්‍යයෙහි ප්‍රචාරය කිරීමට / පළ කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කර සලකමි.

**ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ**
විභාග කොමසාරිස් ජනරාල්

# මාධ්‍ය නිවේදනය

**ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග**
**ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ/මධ්‍යම/අවසාන විභාගය - 2024 (2025)**
**උත්තර පත්‍ර නැවත සමීක්ෂණය**

උක්ත විභාගයේ උත්තර පත්‍ර නැවත සමීක්ෂණය කිරීම සඳහා වන අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය 2025.10.31 වේ.

03. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීමට උපදෙස් පත්‍රිකාව සහ අයදුම්පත්‍රය සියලුම **පරිවේණාධිපතිවරුන් / ප්‍රධානාචාර්යවරුන්** හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යොමු කර ඇත. www.doenets.lk වෙබ් අඩවියේ ද උපදෙස් පත්‍රිකාව හා අයදුම්පත්‍රය බාගත කර ගැනීමේ පහසුකම් සලසා ඇත.

04. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණ ගාස්තුව රු. 200/= කි. (දෙසීයයකි.) තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවීම් සිදු කළ යුතුය.

05. මුදල් ගෙවූ රිසිට් පතේ මුල් පිටපත අයදුම්පතේ පසුපිටේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. පසු ප්‍රයෝජනය සඳහා රිසිට් පතේ පිටපතක් ළඟ තබා ගන්න. අයදුම්පත **පරිවේණාධිපති / ප්‍රධානාචාර්ය නිර්දේශය සහිතව** පහත ලිපිනයට එවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්,**
**ආයතනික විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**තැ.පෙ. 1503, කොළඹ.**

06. නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය **එක් එක් විෂයන් සඳහා වෙන වෙනම** අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මුදල් ගෙවූ රිසිට් පත්ද වෙන වෙනම අලවා තිබිය යුතුය. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. අදාළ ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

07. මෙම සම්බන්ධයෙන් යම් විමසීමක් වේ නම් පහත සඳහන් දුරකථන අංක භාවිත කළ හැකිය.

| | |
|---|---|
| ආයතනික විභාග ඇගයීම් ශාඛාව | **011-2785105 / 011-2786235** |

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්